**ජාතික ව්‍යාපාර කළමනාකාර්ත්ව ආයතනය**

-------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ජාතික ව්‍යාපාර කළමනාකාර්ත්ව ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යාපාර කළමනාකාර්ත්ව ආයතනයේ ක්‍රියාකාර්ත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-------------------------------------------

2.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2011 පෙබරවාරි 24 දින ඉදිරිපත් කරන ලද කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සිදුකල සෝදිසි පරීක්ෂාවේදී අනාවරණයවූ ගණකාධිකරණ අඩුපාඩු ඇතුළත් වාර්තාවක් 2011 අප්‍රේල් 05 දින ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. එම අඩුපාඩු නිවැරදි කර සංශෝධිත ගිණුම් 2011 මැයි 05 දින ඉදිරිපත් කර තිබුණි.

2.2 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ පාරිතෝෂික ගෙවීම සඳහා රු. 17,234,144 ක්වූ ප්‍රතිපාදනයක් කර අදාල බැරකම් පියවීම සඳහා උපයෝජනය කර ගැනීමට අරමුදල් ආයෝජනය කර ඇතත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව ඒ බව හදුනාගත හැකිවන පරිදි ආයෝජනය වෙනම ගිණුම්වල හෙලිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව මෙහෙයුම් කටයුතු සඳහා යොදාගන්නා වත්කම් අගයකර ගිණුම්ගත කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශයන්හි ස්ථාවර වත්කම්වල අගය හීනවූ වටිනාකම රු. 1 කට දැක්වෙන අයිතම් 600 ක්ද රු. 2 සිට රු. 100 දක්වා වූ අයිතමයන් 440 ක්ද පැවති අතර ඒවා නැවත අගය කර ගිණුම්ගත කර නොතිබුණි.

## 2.3 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය සහ 2004 ජූලි 29 දිනැති අංක පර්ඩී 25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව රාජ්‍ය බැංකුවක රු. 90,000,000 ක් ආයෝජනය කර තිබුණි.

## 03. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

---

## 3.1 මූල්‍ය සමාලෝචනය

---

### 3.1.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩ කටයුතු වලින් බදුවලට පසු රු. 96,314,318 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදුවලට පසු අතිරික්තය රු. 61,257,450 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයෙ බදුවලට පසු ලාභයේ රු. 35,056,868 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. වැටුප් , උපදේශක හා පුහුණු වියදම් වැඩිවීමට සාපේක්ෂව පාඨමාලා ආදායම් හා අනෙකුත් ආදායම් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.1.2 මූල්‍ය ප්‍රතිඵල සංසන්දනාත්මක විශ්ලේෂණය

---

ආයතනයේ සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක ආදායම්, වියදම්, ලාභදායීත්වය සහ ශිෂ්‍ය සහභාගීත්වය පිළිබඳ තොරතුරු සංසන්දනය කර පහත දැක්වේ.

| විස්තරය | | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|
| ආදායම | රු. | 524,008,538 | 366,178,891 | 298,241,785 | 238,006,772 | 196,080,898 |
| වියදම | රු. | 427,694,220 | 304,921,441 | 235,720,708 | 203,443,037 | 163,482,699 |
| ආදායම් අතිරික්තය (බදුවලට පසු) | රු. | 96,314,318 | 61,257,450 | 62,521,077 | 34,563,735 | 32,598,199 |
| ශිෂ්‍ය සහභාගිත්වය | | 10,697 | 7,018 | 6,853 | 6,677 | 8,621 |
| ඒක ශිෂ්‍ය පිරිවැය | රු. | 39,983 | 43,448 | 34,397 | 30,469 | 18,963 |
| ඒක ශිෂ්‍ය ආදායම | රු. | 48,986 | 52,177 | 43,520 | 35,646 | 22,744 |

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2009 වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ආදායම 43% කින් වැඩිවුවද ඒක ශිෂ්‍ය ආදායම 6% කින් අඩුවී තිබුණි.

(ආ) 2009 වර්ෂයට සාපේක්ෂව ශිෂ්‍ය සහභාගීත්වය 52% කින් වැඩිවීමේදී ඒක ශිෂ්‍ය පිරිවැය අඩුවීමේ ප්‍රතිශතය 8 % කි.

## 3.2 මෙහෙයුම් සමාලෝචනය

### 3.2.1 කාර්ය සාධනය

#### (අ) දේශන පැවැත්වීම

අධ්‍යක්ෂ ජනරාල් විසින් ආයතන සංග්‍රහය හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, උපදෙස් වලට පටහැනිව පාලක සභාවේ අනුමැතිය ඇතිව නිකුත් කර ඇති 2008 ජුනි 20 දිනැති චක්‍රලේඛය ප්‍රකාර පැය 20 ක් දේශන පැවැත්වීමට තීරණය කර ඇතත් එය සතියකට ද මාසයකටද යන්න තීරණය නොකිරීම හේතුවෙන් මසකට පැය 20 ඉක්මවූ පැය ගණනය කර අතිරේක ගෙවීම් කර තිබුණි.

#### (ආ) පාඨමාලා පැවැත්වීමේ ප්‍රගතිය

(i) ආයතනය විසින් පවත්වනු ලබන විවිධ පාඨමාලා පිළිබඳ පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

| පාඨමාලාවේ නම | පාඨමාලා අංකය | ලියාපදිංචි සිසුන් ගණන | පළමුවරට විභාගයට පෙනී සිටි සිසුන් ගණන | සමත් සිසුන් ගණන | අසමත් සිසුන් ගණන | අසමත්වීමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|
| පරිගණක විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව | 450669 2009.3 | 128 | 97 | 67 | 30 | 30 |
| - එම - | 450010 2010.1 | 262 | 232 | 135 | 97 | 42 |
| - එම - | 450110 2010.1(2) | 70 | 62 | 36 | 26 | 42 |

ඉහත විස්තර අනුව විභාගයට පළමුවරට පෙනී සිට අසමත්වීමේ ප්‍රතිශතය 30 % - 42% අතර පවතින බව නිරීක්ෂණය විය.

(ii) පරිගණක පද්ධති නිර්මාණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (2008.1) සඳහා ලියාපදිංචි සිසුන් 229 ක් වූ අතර ඉන් 225 දෙනෙකු පළමුවරට විභාගයට පෙනී සිට තිබුණි. එම සිසුන් අතරින් 79 දෙනෙකු පමණක් විභාගය සමත්ව සිටි අතර එය ප්‍රතිශතයක් වශයෙන් ගත්කළ 35% ක් වැනි ඉතා අඩු ප්‍රතිශතයක් බව නිරීක්ෂණය විය.

### 3.2.2 මෙහෙයුම් අංශවල සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී ආයතනය තම කාර්යයන් අංශ 03 ක් හා ශාඛා 03 ක් මගින් ඉටුකර තිබුණි. පහත දැක්වෙන තොරතුරු වලින් මෙම අංශවල මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ විස්තර නිරූපණය වේ.

| අංශය / ශාඛාව | ආදායම | වියදම | අතිරික්තය / (ඌනතාවය) |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| කළමනාකරණ තොරතුරු අංශය | 185,204,558 | 94,565,380 | 90,639,178 |
| කළමනාකරණ සංවර්ධන අංශය | 216,791,200 | 117,379,932 | 99,411,268 |
| කුරුණෑගල ශාඛාව | 54,249,513 | 38,035,166 | 16,214,347 |
| මහනුවර ශාඛාව | 23,059,947 | 17,805,485 | 5,254,462 |
| ගාල්ල ශාඛාව | 32,547,103 | 34,191,700 | (1,644,597) |
| පාලන අංශය | 12,156,217 | 110,278,820 | (98,122,603) |
| බදු සහ ඉකුත් වර්ෂ ගැලපීම් | - | - | (15,437,737) |
| | | | 96,314,318 |

ගාල්ල ශාඛාව සහ පාලන අංශයේ මූල්‍ය ප්‍රතිඵල බදු හා ඉකුත් වර්ෂ ගැලපීමට පෙර පිළිවෙලින් රු. 1,644,597 ක හා රු. 98,122,603 ක ඌනතාවයකි.

### 3.2.3 අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

-------------------------------

පනතට අනුව සාමාජිකයන් 11 දෙනෙකුගෙන් සමන්විත පාලක සභාවට පත්වියයුතු ශ්‍රී ලංකා කර්මාන්ත උපදේශක සභාවේ සභාපති, ජාතික සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරී, වාණිජ බැංකු සංගමයේ සභාපති යන අය පාලක සභාවට පත්කර නොතිබුණි.

### 4. පද්ධති හා පාලන.

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) දේශන පැවැත්වීම
(ආ) පාඨමාලා පවත්වා ගෙනයාම
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ආයෝජන
(ඉ) ශාඛාවල කාර්ය සාධනය